<u>සිංහල පරිවර්තනය</u>

**2026 ඔක්තෝම්බර් 27**

<u>හෝමාගම පොලිස් අත්අඩංගුවේ සිටිය දී සැකකරුවෙකු මියයාම පිළිබඳ ප්‍රකාශය</u>

මත්ද්‍රව්‍ය සම්බන්ධ විමර්ශනයකට අදාළව අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුව, හෝමාගම පොලිස් ස්ථානයේ රඳවා සිටියදී කිරිවත්තුඩුවේ පදිංචි, දෙදරු පියෙකු වන 29 හැවිරිදි ඉෂාර හර්ෂකුමාරගේ මියයාම සම්බන්ධයෙන ශ්‍රී ලංකා නීතිඥ සංගමය (BASL) සිය දැඩි කනස්සල්ල පළ කර සිටියි.

වාර්තා වන ආකාරයට, 2026 ඔක්තෝබර් 25 වන දින උදෑසන හෝමාගම පොලිස් ස්ථානය වෙත ගොස් ඔහුගේ තත්ත්වය විමසා බැලූ පවුලේ සාමාජිකයන් ප්‍රකාශ කර ඇත්තේ, දැඩි ලෙස පහර දී ඇති බව පෙනී යන ශාරීරික තුවාල තමන් නිරීක්ෂණය කළ බවයි. ඊට පටහැනිව, පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා සඳහන් කර ඇත්තේ මෙහෙයුමක් අතරතුර සැකකරු හදිසි අසනීප තත්ත්වයකට මුහුණ දී ඇති බවත්, රෝහල්ගත කිරීමෙන් පසු ඔහු මියගිය බවත් ය. මෙම තත්ත්වයන් යටතේ මෙම මරණයට හේතු වූ පසුබිම සම්පූර්ණයෙන් හා ස්වාධීන ලෙස තහවුරු කර ගැනීමත්, ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති පරස්පර ප්‍රකාශ හා ගැටළු විනිවිදභාවයකින් යුත් විශ්වසනීය පරීක්ෂණයකට ලක් කිරීමත් අත්‍යවශ්‍ය බව ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ විශ්වාසය වේ.

අත්අඩංගුවේ සිටියදී සිදුවන මරණයක් යනු ඉතා දැඩි ලෙස අවධානය යොමු කළ යුතු කරුණක් බවත්, තම අත්අඩංගුවේ පසුවන සෑම තැනැත්තෙකුගේම ජීවිතය, සෞඛ්‍යය සහ ශාරීරික අඛණ්ඩතාව ආරක්ෂා කිරීම රාජ්‍යයේ මූලික හා පැහැර හැරිය නොහැකි වගකීමක් බවත් ශ්‍රී ලංකා නීතිඥ සංගමය අවධාරණය කරයි. එම නිසා, අත්අඩංගුවේදී සිදුවන හිංසනයන් හෝ වැරදි ලෙස සැලකීම් පිළිබඳ ඕනෑම චෝදනාවක් සම්බන්ධයෙන් උපරිම අවධානය යොමු කළ යුතු අතර, ඒවා තහවුරු වුවහොත් නීතියට අනුකූලව දැඩි ලෙස ක්‍රියා කළ යුතුය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(4) වගන්තිය සහ ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චිත නඩු තීන්දු මගින් ද තහවුරු කර ඇත්තේ, නිසි අධිකරණයක නියෝගයකින් හැර අන් කිසිදු අයුරකින් පුද්ගලයෙකුගේ ජීවිතය අහිමි කිරීම දඬුවමක් ලෙස පැනවිය නොහැකි බවයි. ඒ හරහා අත්අඩංගුවේ පසුවන පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සහ ගෞරවය පූර්ණ ලෙස ආරක්ෂා කිරීමට නීතිය බලගන්වන බලධාරීන් බැඳී සිටින බව නැවත නැවතත් තහවුරු කෙරේ.

හෝමාගම මහේස්ත්‍රාත් අධිකරණය විසින් පශ්චාත් මරණ පරීක්ෂණයක් පැවැත්වීමට නියෝග කර ඇති බවත්, හෝමාගම සහකාර පොලිස් අධිකාරීවරයාගේ (ASP) උපදෙස් මත මූලික විමර්ශනයක් ආරම්භ කර ඇති බවත් ශ්‍රී ලංකා නීතිඥ සංගමය (BASL) විසින් සැලකිල්ලට ගෙන ඇත. අත්අඩංගුවේ සිටියදී සිදුවූ බවට චෝදනා එල්ල වන ප්‍රචණ්ඩත්වය සම්බන්ධ මෙවැනි සිදුවීමකදී, මහජන විශ්වාසය තහවුරු කිරීම සඳහා සාධාරණ සැකයකට හෝ ප්‍රශ්නයකට ඉඩ නොතබා සියලු කරුණු විමර්ශනය කිරීම අත්‍යවශ්‍ය වේ. එමෙන්ම, යම් පුද්ගලයෙකු වරදක් සිදු කර ඇති බව තහවුරු වුවහොත්, ඔහු හෝ ඇය නීතියට අනුකූලව වගවීමට යටත් කළ යුතුය.

ඒ අනුව, ඉෂාර හර්ෂකුමාරගේ මරණය සිදුවූ පසුබිම පිළිබඳව වහාම ක්‍රියාත්මක වන පරිදි, අපක්ෂපාතී, විනිවිදභාවයෙන් යුතු සහ පුළුල් පරීක්ෂණයක් පවත්වන ලෙසත්, ඊට අදාළ සියලු සාක්ෂි නිසි ලෙස සංරක්ෂණය කර පරීක්ෂා කරන ලෙසත්, කිසිදු බාහිර බලපෑමකින් හෝ පූර්ව විනිශ්චයකින් තොරව විමර්ශනය මෙහෙයවන ලෙසත් ශ්‍රී ලංකා නීතිඥ සංගමය පොලිස්පතිවරයාගෙන් සහ සියලු නිසි බලධාරීන්ගෙන් ඉල්ලා සිටී.



President Rajeev Amarasuriya | Deputy President Rienzie Arsecularatne PC | Secretary Nalin De Silva | Treasurer Pasindu Silva | Assistant Secretary Lakitha Wakishta Arachchi

No. 153, Mihindu Mawatha, Colombo 12, Sri Lanka.
Telephone : +94 11 2447134, +94 11 2331697, Fax : +94 11 2331697 E-mail : info@basl.lk Web : www.basl.lk

නිසි විමර්ශනයක් හරහා තහවුරු වුවහොත්, අත්අඩංගුවේදී සිදුවන ඕනෑම හිංසනයක් හෝ නීති විරෝධී ලෙස ජීවිතය අහිමි කිරීමක් ශ්‍රී ලංකා නීතිඥ සංගමය හෙළා දකින අතර, කරුණු තීරණය කළ යුත්තේ සාධාරණ, ස්වාධීන සහ විශ්වසනීය ක්‍රියාවලියක් හරහා බව නැවත නැවතත් ප්‍රකාශ කර සිටියි. මේ සම්බන්ධයෙන් අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා නීතිඥ සංගමය (BASL) ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලබන අතර, ඒ පිළිබඳව සිය සාමාජිකත්වය සහ මහජනතාව දැනුවත් කිරීමට ද කටයුතු කරනු ඇත.

*අත්සන් කළේ*

| | |
|---|---|
| **රජීව් අමරසූරිය** | **නලින් ද සිල්වා** |
| **සභාපති** | **ලේකම්** |
| **ශ්‍රී ලංකා නීතිඥ සංගමය** | **ශ්‍රී ලංකා නීතිඥ සංගමය** |



President Rajeev Amarasuriya | Deputy President Rienzie Arsecularatne PC | Secretary Nalin De Silva | Treasurer Pasindu Silva | Assistant Secretary Lakitha Wakishta Arachchi

No. 153, Mihindu Mawatha, Colombo 12, Sri Lanka.
Telephone : +94 11 2447134, +94 11 2331697, Fax : +94 11 2331697 E-mail : info@basl.lk Web : www.basl.lk